# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2125/58 - 2019 මැයි මස 31 වැනි සිකුරාදා - 2019.05.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 1/2018

**2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත**

2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 33 වන වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

මංගල සමරවීර,
මුදල් අමාත්‍ය.

2019 මැයි මස 31 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 2019 අංක 01 දරන මුදල් ව්‍යාපාර (මුදල් සමාගමක් ගණන් බේරා වසාදැමීමේ දී හිමිකම් පෑම්වල ප්‍රමුඛතාව සම්බන්ධයෙන් වන) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මේ නියෝග මුදල් සමාගමක් ගණන් බේරා වසාදැමීමේ දී පවතින වරණීය හිමිකම් පෑම් සඳහා අදාළ වන්නේ ය.

3. (1) ඈවරකරු විසින් මෙම නියෝගවල උපලේඛනයේ දක්වා ඇති වියදම්, ගාස්තු සහ හිමිකම් පෑම්, ඒවායේ භාවයට අනුකූලව, එම උපලේඛනයේ සඳහන් ප්‍රමාණයන් සහ ප්‍රමුඛතා අනුපිළිවෙල අනුව සමාගමේ වත්කම්වලින් ගෙවිය යුතු ය.

(2) මෙහි (1) ඡේදයේ සඳහන් 'වත්කම්' යන වචනය යටතට, බැඳීමකට යටත් යම් වත්කමක්

(අ) 2007 අංක 7 දරන සමාගම් පනතේ 358 වන වගන්තිය යටතේ පවාරණය කරනු ලැබ හෝ පවාරණය කිරීමට ගනු ලැබ හෝ නිදහස් කරනු ලැබ ඇත්නම් මිස ; හෝ

(ආ) බැඳීම් ඇති කරනු ලබන විට, එම බැඳීම ඒ වත්කම් සම්බන්ධයෙන් අස්ථිර බැඳීමක් වූයේ නම් මිස,

ඇතුළත් නොවිය යුතු ය.

4. 3(1) වන නියෝගය ප්‍රකාරව වරණීය හිමිකම් පෑම් ගෙවීම අවසන් වීමෙන් පසුව ඈවරකරු විසින්, 2007 අංක 7 දරන සමාගම් පනතේ විධිවිධාන ප්‍රකාරව වෙනත් සියලු හිමිකම් පෑම් සපුරාලීම සඳහා සමාගමේ වත්කම් යොදා ගනු ලැබිය යුතු ය.

5. මේ නියෝග බලාත්මක වීමෙන් පසු ව යම් මුදල් සමාගමක් ඈවර කිරීමක දී 2007 අංක 7 දරන සමාගම් පනතේ නව වන උපලේඛනයේ දක්වා ඇති වරණීය හිමිකම් පෑම් අදාළ නොවිය යුතු ය.


1A - PG 4538 — 500 (2019/05)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

[3 වන නියෝගය]

**උපලේඛනය**

***වරණීය හිමිකම් පෑම්***

මුදල් සමාගමේ වත්කම්වලට එරෙහිව පහත සඳහන් අනුපිළිවෙල අනුව මෙම උපලේඛනයේ දක්වා ඇති හිමිකම් පෑම් සඳහා ප්‍රමුඛතාව හිමිවිය යුතු ය. මෙම උපලේඛනයේ 3 වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති හිමිකම් පෑම් එකී හිමිකම් පෑම් අතර සම තලයක පැවතිය යුතු වන්නා සේම එම හිමිකම් පෑම් සම්පූර්ණයෙන්ම ගෙවනු ලැබිය යුතු අතර එකී හිමිකම් පෑම් සපුරාලීම සඳහා වත්කම් ප්‍රමාණවත් නොවන අවස්ථාවක දී පමණක් සමානුපාතිකව අවකරණය විය යුතු ය:-

1. ඈවරුකරු වශයෙන් ස්වකීය කාර්ය ඉටුකිරීමේ දී සහ බලතල ක්‍රියාත්මක කිරීමේ දී ඈවරකරුට දැරීමට සිදුවන ගාස්තු, වියදම් සහ ඈවරකරුගේ පාරිශ්‍රමික.

2. ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය (SLDILSS) වෙත ගෙවිය යුතු හිඟ වාරික.

3. ඉන්පසුව පහත දැක්වෙන හිමිකම් පෑම් සඳහා ගෙවීම් කරනු ලැබිය යුතු ය:-

(අ) යම් සේවා නියුක්තිකයකුට අයවිය යුතු සියලු අර්ථසාධක අරමුදල්, සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල් සහ පාරිතෝෂික ගෙවීම් ;

(ආ) ඈවර කිරීම ආරම්භ කිරීමේ දිනයට පෙරාතුව වූ මාස දොළහකට කාලසීමාවක් ඇතුළත සමාගමෙන් අය විය යුතු වූ සහ ගෙවිය යුතු වූ සහ ඈවර කිරීම ආරම්භ කිරීමේ දී සමාගමෙන් අයවිය යුතු වූ සියලු වරිපනම් සහ බදු මුදල් ;

(ඇ) කලින් කලට කරනු ලැබුවා වූ හෝ සපයනු ලැබුවා වූ යම් සේවාවන් සඳහා පුනරාවර්තන ගෙවීම් වශයෙන් රජයට අයවිය යුතු සියලු අයවීම් ;

(ඈ) යම් සේවා නියුක්තිකයකුට ගෙවිය යුතු කාර්මික අධිකරණ ප්‍රදාන සහ වෙනත් යම් ව්‍යවස්ථාපිත අයකිරීම් ; සහ

(ඉ) යම් සේවා නියුක්තිකයකුට, ඈවර කිරීමේ කෘත්‍ය ආරම්භවීමට පෙරාතුවම වූ ආසන්න මාස තුනක කාලසීමාව ඇතුළත මුදල් සමාගම වෙත සපයන ලද සේවා සම්බන්ධයෙන් ගෙවිය යුතු සහ සම්පූර්ණයෙන්ම හෝ කොටසක් වශයෙන් හෝ කොමිස් මුදල් වශයෙන් උපයන ලද හෝ එසේ උපයනු නොලැබූ වේතන හෝ වැටුප් ;

එසේ වුවද, යම් සේවා නියුක්තිකයකුට ගෙවිය යුතු මුදල, එම ඈවර කිරීම ආරම්භයේ දී ඈවරකරු විසින් නිශ්චය කරනු ලැබූ උපරිම මුදල නොඉක්මවිය යුතු ය.

එසේ වුවද,

(අ) ශ්‍රී ලංකාවේ හෝ විදේශයන් හි පවතින යම් පොලිසියක්, නියාමන හෝ අධීක්ෂණ අධිකාරියක්, වෘත්තීය වේදීන්ගේ සංගමයක්, විමර්ශන කොමිෂන් සභාවක්, විනිශ්චය සභාවක් හෝ නීතිමය මඟින් පිහිටුවන ලද වෙනත් යම් මණ්ඩලයක් විසින් යම් වංචාවක්, රැවටීමක්, වංක ක්‍රියාවක් හෝ වෙනත් ඒ හා සමාන සාපරාධී ක්‍රියාවකට සම්බන්ධ යම් කටයුත්තක් පිළිබඳව පවත්වනු ලබන යම් විමර්ශනයකට හෝ විභාග කිරීමකට යටත් වූ ; හෝ

(ආ) යම් වංචාවක්, රැවටීමක්, වංක ක්‍රියාවක්, අනිසි හැසිරීමක් හෝ යම් නීතියක විධිවිධානයන්ට හෝ ඒ යටතේ සාදන ලද්දා වූ රීති, නියෝග, විධාන හෝ නිශ්චයකිරීම්වලට අනුකූල නොවීමක් සම්බන්ධවන ක්‍රියාවක් පිළිබඳව ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි පවතින යම් අධිකරණයකින්, නියාමන හෝ අධීක්ෂණ අධිකාරියකින්, වෘත්තීයවේදීන්ගේ සංගමයකින්, විමර්ශන කොමිෂන් සභාවක් මගින් විනිශ්චය සභාවක් මගින් හෝ නීතිය මගින් පිහිටුවන ලද වෙනත් යම්

මණ්ඩලයකින් වරදකරුවකු බවට පත් වූ,

(i) යම් සේවා නියුක්තයකු ;

(ii) විධායක කර්තව්‍ය ඉටුකරනු ලබන අධ්‍යක්ෂවරයෙකු/අධ්‍යක්ෂවරුන් සහ නිලධාරියකු/නිලධාරීන් ;

ඔවුන්ගේ වේතන හෝ වැටුප් සඳහා වූ හිමිකම් පෑම් හෝ එයට අදාළ වූ වෙනත් හිමිකම් ලබාගැනීම සඳහා, හිමිකම් නොලබන්නේ ය.

4. ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය (SLDILSS) යටතේ ආවරණය නොවන්නා වූ තැන්පත්කරුවන් සහ ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය (SLDILSS) යටතේ තැන්පතුවලින් කොටසක් ආවරණය වූ තැන්පත්කරුවන් ;

එසේ වුව ද,

(අ) ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි පවතින යම් පොලීසියක්, නියාමන හෝ අධීක්ෂණ අධිකාරියක්, වෘත්තීයවේදීන්ගේ සංගමයක්, විමර්ශන කොමිෂන් සභාවක්, විනිශ්චය සභාවක් හෝ නීතිය මගින් පිහිටුවන ලද වෙනත් යම් මණ්ඩලයක් විසින් යම් වංචාවක්, රැවටීමක්, වංක ක්‍රියාවක් හෝ වෙනත් ඒ හා සමාන සාපරාධී ක්‍රියාවකට සම්බන්ධ යම් කටයුත්තක් පිළිබඳව පවත්වනු ලබන යම් විමර්ශනයකට හෝ විභාග කිරීමකට යටත් වන්නා වූ ; හෝ

(ආ) යම් වංචාවක්, රැවටීමක්, වංක ක්‍රියාවක්, අනිසි හැසිරීමක් හෝ යම් නීතියක විධිවිධානයන්ට හෝ ඒ යටතේ සාදන ලද්දා වූ රීති, නියෝග, විධාන හෝ නිශ්චයකිරීම්වලට අනුකූල නොවීමක් සම්බන්ධවන ක්‍රියාවක් පිළිබඳව ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි පවතින යම් අධිකරණයකින්, නියාමන හෝ අධීක්ෂණ අධිකාරියකින්, වෘත්තීයවේදීන්ගේ සංගමයකින්, විමර්ශන කොමිෂන් සභාවක් මගින් විනිශ්චය සභාවක් මගින් හෝ නීතිය මගින් පිහිටුවන ලද වෙනත් යම් මණ්ඩලයකින් වරදකරුවකු බවට පත් වූ,

(i) මුදල් සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ ;

(ii) මුදල් සමාගමේ විධායක කර්තව්‍ය ඉටු කරනු ලබන නිලධරයන්ගේ ;

(iii) මුදල් සමාගමේ පරිපාලිත සමාගම්වල ;

(iv) මුදල් සමාගමේ ආශ්‍රිත සමාගම්වල ;

(v) මුදල් සමාගමේ විධායක කර්තව්‍ය ඉටුකරනු ලබන අධ්‍යක්ෂවරයකුගේ හෝ නිලධරයකුගේ යම් ඥාතියකුගේ ;

(vi) මුදල් සමාගමේ ප්‍රමාණාත්මක බැඳියාවක් ඇති යම් කොටස් කරුවකුගේ.

තැන්පතු වගකීම් ඇතුළත් කරනු නොලැබිය යුතු ය.

5. ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය (SLDILSS) මගින් ඇවර කිරීමට යටත් සමාගමේ තැන්පත්කරුවන් වෙත ගෙවනු ලැබ ඇති වන්දි මුදල්.

6. මෙහි උපලේඛනයේ 2 සහ 5 ඡේදවල නිශ්චිතව දක්වා ඇති අයවිය යුතු මුදල් හැර ශ්‍රී ලංකා මහ බැංකුව වෙත අයවිය යුතු වෙනත් මුදල්.

06 - 434

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.